ර/ බල / බුලත්ගම විද්‍යාලය

| | |
|---|---|
| 7 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය |
| තෙවන වාර පරීක්ෂණය | |
| කාලය පැය දෙකයි | සැකසුම : B.B.D. සඳමාලි |

●පහත සදහන් ප්‍රස්ථාව පිරුළුවල හිස්තැනට සුදුසු පදය තෝරා යටින් ඉරක් අදින්න.

1.) ඉබ්බා .....................දියට දැම්මා වගෙයි

i.බිමට ii. දියට iii.ළිඳට iv. මඩට

2.) ඉඟුරු දී................. ගත්තා වගෙයි

i. කහ ii. ලූණු iii. මිරිස් iv. දුරු

3.) පිස්සිගෙ ................. වගෙයි

i. ගෙදර ii. මුහුණ iii. ඇදුම iv. පලා මල්ල

4. )"සාරාර්ථ සංග්‍රහය " සාස්ත්‍රීය ග්‍රන්ථය රචනා කරන ලද්දේ

i. වැත්තැවේ හිමි ii. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

iii. වැලිවිට සරණංකර හිමි iv. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

5. )වර්ථමාන සිංහල හෝඩියේ සම්පූර්ණ අක්ෂර ගණන

i. 58 ii. 60 iii. 62 iv. 32

●පහත දැක්වෙන පද අතරින් සමානාර්ථ පදයක් නොවන පදය යටින් ඉරක් අදින්න

6. ) සූර්යයා

i. තරුපති ii. දිනිඳු

iii. දිනකර iv. රිවි

7. ) සයුර

i. සිඳු ii. නදිය

iii.සාගරය iv.සමුද්‍රය

●පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථය දෙන පදය තෝරා ඉරක් අදින්න

8. )අළුයම → අරුණෝදය හිමිදිරිය සැන්දෑව

9.) පොළොව → මිහිකත ගුවන භූමිය

●පහත දැක්වෙන අදහස්වලට ගැලපෙන තනි පදය තෝරා ඉරක් අදින්න

10.)දිය බුබුලක හැඩය ගන්නා

i. අම්ලාකාර ii. පද්මාකාර iii. බුබ්බුලාකාර iv. සටාකාර

11.)වැවක ජලය බැස යාමට ඇති දොරටුව

i. රළපනාව ii. වැව් බැම්ම

iii. සොරොව්ව iv. බිසෝ කොටුව

12.) පහත සදහන් පද අතරින් ක්‍රියා විශේෂණයක් නොවන පදය තෝරන්න

i. ලස්සනට නටයි ii. වේගයෙන් දුවයි

iii.රසවත් ආහාරය iv. හයියෙන් අඬයි

**●පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන පදය තෝරා ලියන්න**

13. )ගස් සුළඟට .............................

i. නැමෙයි ii. නැමෙති

iii.නැමෙන්නෙහි iv. නැමෙන්නෙහු

14. )............................ගීයක් ගැයුවා ය

i.නුඹ ii. අපි

iii.ඇය iv. ඔවුහු

**●පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇදි පදය ඇතුළත් පද වර්ගය තෝරා ලියන්න**

15. )මම විහාරස්ථානයට ගොස් බුදුන් වැන්දෙමි

i .පූර්ව ක්‍රියා ii. විධි ක්‍රියා

iii. මිශ්‍ර ක්‍රියා iv. ආශීර්වාද ක්‍රියා

16. )නංගී ගී ගයමින් නැටුවා ය

i.පූර්ව ක්‍රියා ii. මිශ්‍ර ක්‍රියා

iii විධි ක්‍රියා iv. ආශීර්වාද ක්‍රියා

**●පහත සදහන් ප්‍රස්ථාව පිරුළුවල අර්ථය තෝරා යා කරන්න**

| A | B |
|---|---|
| 17. ) කළුවා මාරපන් ගියා වගෙයි | නොගැළපෙන පරිදි පිළියම් යෙදීම |
| 18.) හිසරදයට කොට්ටය මාරු කළා වගෙයි | කළ යුතුදේ නොදැන ක්‍රියා කිරීම |
| 19. ) මඬේ සිටවූ ඉන්න වගෙයි | තමන්ට අය් නැති කාර්යයක් කිරීම |
| 20. ) බල්ලගේ වැඩේ බූරුවා කළා වගෙයි | ස්ථිර අදහසක් නොමැති වීම |

2 ×20 = ලකුණු 40

11 කොටස

01) පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

i ) "ඛ " අක්ෂරය යෙදුණු වචන දෙකක් ලියන්න

ii) ඔබ දන්නා ආප්තෝපදේශයක් ලියන්න

iii) ජන කවිවල ලක්ෂණයක් ලියන්න

iv) ක්‍රියා පදවල මූලික බේදීම් දෙක නම් කරන්න

v)"තොප්පි වෙළෙන්දා "නාට්‍ය කාගේ නිර්මාණයක් ද? ( ලකුණු 05 යි )

02 ) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න

i) මම ගඟක් වෙමි

ii) ප්‍රිය වචන කා කරමු

iii) පරිසරයට ආදරය කරමු

iv) උගතමනා ශිල්පයමයි මතු රැකෙනා ( ලකුණු 20 යි )

03) පහත වගුව සම්පූර්ණ කරන්න

| | පාඨය | පාඩම | පැවසුවේ කව්ද | පැවසුවේ කාටද |
|---|---|---|---|---|
| 01 | "කම්මැලි රාල ! මම වැඩ පටන් ගත්තා විතරයි. දවසේ වැඩ ඉවර කරලාත් එනවා ද? " | | | |
| 02 | "සිරිමල් පුතේ,අම්බරුවන් පිට කමත් කරන්න." | | | |
| 03 | "දිසාපාමොක් ආචාරීන් වහන්ස, තමන් වහන්සේගේ අතවැස්සන් ලවා මාගේ තල ගන්නා සේකැ " | | | |
| 04 | "මම ලොකු වුණාම ටිකට් විකුණන කෙනෙක් වෙනවා " | | | |
| 05 | "අනේ කමක් නෑ හාමිනේ පුංචි අයගේ ආසාවනි " | | | |

3× 5 = ලකුණු 15 යි

04 ) පහත දැක්වෙන වගුවේ හිස්තැන් පුරවන්න

| උක්ත රූපය | අනුක්ත රූපය |
|---|---|
| මම | |
| | තා |
| කාන්තාවක් | |
| | මේසය |
| ඔවුහු | |

1×5 - ලකුණු 05 යි

පහත ප්‍රශ්නවලින් එකක් තෝරාගෙන පිළිතුරු ලියන්න

01) ඔබ දෙමාපියන් සමග පෙරහැරක් නැරඹීමට ගොස් ඔවුන්ගෙන් මඟඇරී අතරමං වූ බව සිතන්න. ඔබ අසල සිටින පොලිස් නිලධාරීතුමාගෙන් තම දෙමාපියන් සොයා ගැනීමට උදව් ඉල්ලන ආකාරය දෙබසක් ඇසුරින් නිර්මාණය කරන්න.

02) ඔබ පාසලේ පැවැත්වෙන වසර අවසාන විවිධ ප්‍රසංගයට සහභාගී වන ලෙස ඉල්ලා ආරාධිතයන් වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රය ලියන්න.

(ලකුණු 15 යි )